# රූපවාහිනි ප්‍රවෘත්ති න්‍යාය පත්‍ර විවිධත්වය (තෝරාගත් රූපවාහිනී නාලිකා දෙකක් ඇසුරින්)

*වී.පී.කේ. මදුෂාන් [1], අසිත මල්ලවආරච්චි [2]*

මිනිසා තම හැඟීම් හා අවශ්‍යතාවයන් ප්‍රකාශ කිරීම උදෙසා විවිධ සන්නිවේදන ක්‍රමෝපායන් භාවිත කර ඇත. ඒ අතරින් විද්‍යුත් මාධ්‍යට අයත් රූපවාහිනී මාධ්‍ය යනු විශාල ප්‍රේක්ෂක පිරිසකට දෘශ්‍ය හා ශ්‍රව්‍ය අන්තර්ගතය සම්ප්‍රේෂණය කරන බහුලව භාවිත වන සන්නිවේදන මාධ්‍යකි. ඒ අනුව ප්‍රධාන රූපවාහිනී නාලිකාවන් කිහිපයක් ඇසුරෙන් රූපවාහිනී ප්‍රවෘත්ති න්‍යාය පත්‍ර නාලිකාවන් නාලිකාවට වෙනස් වන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. මෙහි අධ්‍යයන සීමාව වශයෙන් ශ්‍රී ලංකාවේ විකාශය වන ප්‍රධාන රූපවාහිනී නාලිකා දෙකක් තෝරා ගන්නා ලදී. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ තෝරාගත් රූපවාහිනී නාලිකා දෙකෙහි ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයන් සති දෙකක කාලයක් අධ්‍යයනය කළ අතර තෝරාගත් ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරුන් පස්දෙනෙකු සමඟ දුරකතන සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. ප්‍රවෘත්ති විකාශයන්වල හා දුරකතන සම්මුඛ සාකච්ඡාවල දත්ත තේමාත්මක විශ්ලේෂණ ක්‍රමය යටතේ විශ්ලේෂණය කරන ලද අතර එහිදි ප්‍රධාන තේමා හයක් හා උප තේමා දහඅටක් හදුනාගතහැකි විය. එම දත්ත විශ්ලේෂණයට අනුව න්‍යායපත්‍ර තුළ දක්නට ලැබෙන සිරස්තලයන්හි සමාජීය, විදේශීය හා ක්‍රීඩා තේමා තුල ඇති සිරස්තල ඇතැම් විට සමාන වුවත් දේශපාලන, ආර්ථික, ආගමික හා අධ්‍යාපන තේමා තුල ඇති සිරස්තල අසමාන වන අවස්ථා ඇත. තවද සම්මුඛ සාකච්ඡා දත්ත විශ්ලේෂණයට අනුව නාලිකාවන්ට ආවේණික වැඩසටහන් ප්‍රවෘත්ති න්‍යාය පත්‍රයේ අන්තර්ගත කර තිබෙන ආකාරයක්, ජනතා ආකර්ෂණය උදෙසා න්‍යාය පත්‍ර වෙනස් කර ඇති ආකාරයක්, රූපවාහිනී ආයතනවලට තොරතුරු ලැබෙන ආකාරය අනුව න්‍යාය පත්‍ර වෙනස් කර ඇති ආකාරයක් හදුනාගත හැකි විය. එසේම ප්‍රධාන රූපවාහිනී නාලිකා තම නාලිකාවට ආවේණික ලෙස ප්‍රවෘත්ති තෝරාගැනීම එම ආයතනයේ ප්‍රතිපත්තිමය තීරණයක් වන අතර රූපවාහිනී ප්‍රවෘත්ති නාළිකාවලින් ලබාදෙන ප්‍රවෘත්තිවල කාලීන වටිනාකම එම ප්‍රතිපත්තිමය තීරණ මත නාළිකාවෙන් නාළිකාවට වෙනස් වේ. එසේම සම්මුඛ සාකච්ඡා දත්ත විශ්ලේෂණයේදී රූපවාහිනී නාලිකා තුළ ක්‍රියාත්මක ප්‍රවෘත්ති තුළින් මහජනයාට විවිධාකාරයේ බලපෑම් (උදා - ආකර්ෂණය, තෝරාගැනීම්) ඇති කරන ආකාරයක් ඇති කරන අතර ඒ හරහා රූපවාහිනි ප්‍රවෘත්ති න්‍යාය පත්‍ර නාළිකාවෙන් නාලිකාවට වෙනස් වන බව මෙහිදී හදුනාගත හැකි විය.

***ප්‍රමුඛ පද:*** රූපවාහිනි, ප්‍රවෘත්ති, න්‍යාය පත්‍ර, නාලිකාව, වෙනස් වීම

[1] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. kavindamadushan621@gmail.com

[2] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. asithaprabhath@ssh.rjt.ac.lk